# ටික් ටොක් සමාජ මාධ්‍ය තාරුණ්‍යයේ පුද්ගල සබඳතා කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

*එච්.පී. මධූෂා දිල්ෂානි [1], එච්.එම්. ගායනා නිර්මාණි හේරත් [2], අසිත මල්ලවච්චි [3]*

සන්නිවේදනය යනු ක්‍රියාවලියකි. සන්නිවේදනයේ අවශ්‍යතාව සමාජයේ පැවැත්ම සඳහා කෙතරම් බලපාන්නේ ද යන්න විවිධ විද්වතුන් විසින් පර්යේෂණ සිදු කොට ඇත. එහෙයින් නූතන සමාජයේ පැවැත්ම සඳහා සන්නිවේදනයේ අවශ්‍යතාව තීව්‍ර ලෙස පවතින යුගයක එහි අවශ්‍යතාව පිළිබඳ විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. මේ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කළ අතර ඒ සම්බන්ධ විද්වතුන් දෙදෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එමෙන් ම ද්විතීයික මූලාශ්‍රය වසයෙන් සන්නිවේදනය හා සමාජය, මාධ්‍යයේ ප්‍රවණතා, නූතන සමාජය සම්බන්ධ ග්‍රන්ථ ද, තෘතීයික මූලාශ්‍රය ලෙස සඟරා, පුවත්පත්, අන්තර්ජාලය ආදිය ද පරිශීලනය කිරීම මඟින් දත්ත ඒකරාශී කර ගැනීම සිදු විය. මෙසේ ගොනු කරගත් දත්ත ආශ්‍රයෙන් නූතන සමාජයේ පැවැත්ම සඳහා සන්නිවේදනයේ දැඩි අවශ්‍යතාව ඇති බව අනාවරණය විය. සන්නිවේදනය හා සමාජය අතර පවතින්නේ අවියෝජනීය වූ සම්බන්ධතාවකි. එනම් එම සම්බන්ධතාව වෙන් කළ නොහැකි ය. එසේ ම මෙම සම්බන්ධතාව ප්‍රබල වේ. සමාජයේ පැවැත්මට මෙන් ම බිඳ වැටීමට ද මෙය හේතු වේ. පුද්ගලයන් අතර පවතින සම්බන්ධතාව වර්ධනය වීමට ශක්තිමත් සන්නිවේදනයක් අවශ්‍ය වේ. මිනිසාට ඇති ප්‍රධාන අවශ්‍යතාවන් ලෙස ආහාරපාන, සනීපාරක්ෂණය, වාසස්ථාන ආදියට අමතර ව අනෙකුත් සියලු කටයුතු කරගැනීම සඳහා සන්නිවේදනය අවශ්‍ය වේ. සමාජයක් පැවැත්මට මෙන් ම එහි ක්‍රියාකාරිත්වයට සන්නිවේදනය අත්‍යවශ්‍ය වන්නේ ඒ නිසා ය. මේ අනුව බලන කළ සමාජයේ පැවැත්මට සන්නිවේදනය පැවතීම අත්‍යවශ්‍ය අංගයක් ලෙස හඳුනාගත හැකි ය. වත්මනේ නව තාක්ෂණය සමඟ හුදකලා වී ඇති මිනිස් සමූහයා සමාජයෙන් වෙන් වී සිටිනු දැකගත හැකි ය. ඔවුන් නිසි පරිදි සමාජානුයෝජනය වන්නේ ද නැත. සන්නිවේදනය නොමැති ව සමාජයේ පැවැත්ම තහවුරු කරගත නොහැකි මෙන් ම සන්නිවේදනයේ පැවැත්මට ද සමාජයක් අවශ්‍ය වේ. අවශ්‍යතාව අනුව යෝග්‍ය ම සන්නිවේදන ක්‍රමය උපයෝගී කරගැනීම මඟින් නිවැරදි ප්‍රතිඵල ළඟා කරගත හැකි බව ද හඳුනාගත හැකි ය. ඒ අනුව සන්නිවේදන කුසලතා වර්ධනය, මාධ්‍ය සාක්ෂරතාව, විචාරශීලී මාධ්‍ය පරිහරණය, අවස්ථෝචිත භාෂා භාවිතය, මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය, මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම, තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය, මාධ්‍ය ආචාරධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය සහ යහපත් පුරවැසියෙකු ලෙස සංවර්ධනයට දායක වීම ආදිය සන්නිවේදනය තුළින් නූතන සමාජයක් යහපත් ලෙස ගොඩනඟා ගැනීමට අවශ්‍ය බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** සන්නිවේදනය, සමාජය, තාක්ෂණය, සමාජානුයෝජනය, අවියෝජනීය

---

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. madhushadilshani977@gmail.com
[2] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. gayananirmani12@gmail.com
[3] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. asithaprabhath@ssh.rjt.ac.lk